(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 181.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 ජූලි මස 25 අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

අතිගරු **මෛත්‍රීපාල සිරිසේන මහතා,** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍යතුමා, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යතුමා සහ ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යතුමා

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **තිලක් මාරපන මහතා,** සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුනි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ලාල් ග්‍රේරු මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු සිසිර කුමාර අබේසේකර මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු විමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු ඊ. සරවනපවන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2017 ජූලි 21 වැනි දින ම'විසින් 'ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන)' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකතුමා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2016.10.01 දින සිට 2016.12.31 දින දක්වා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ රුසියානු සමූහාණ්ඩුව අතර උදර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 07 දිනැති අංක 2022/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම නියමය ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2017 වර්ෂය සඳහා වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වගන්තියේ (1) උපවගන්තිය යටතේ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 31 දිනැති අංක 2021/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2007/2008, 2008/2009, 2009/2010, 2010/2011 සහ 2011/2012 වර්ෂ සඳහා සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා ව්‍යාපාර හා වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය

(6) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2013 සහ 2014 වර්ෂ සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2015/2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්හි වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සහා වාර්තා පිළිගැන්වීම :** (1) තිරසර සංවර්ධන සහ පරිසර හා ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග;

(ii) 2013 වර්ෂය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(iii) 2013 සහ 2014 වර්ෂ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තා;

(iv) 2013 සහ 2014 වර්ෂ සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තා;

(v) 2013 සහ 2014 වර්ෂ සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(vi) 2013 සහ 2014 වර්ෂ සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තා;

(vii) 2012 සහ 2013 වර්ෂ සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තා;

(viii) 2015 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ix) 2015 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ගාමිණී ලොකුගේ මහතා වෙනුවෙන් එහි සභික ගරු ලකී ජයවර්ධන මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත; සහ

(ii) 2012 සහ 2014 වර්ෂ සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන්;

(iii) රේගු ආඥා පනත යටතේ යෝජනාව;

(iv) වාර්ෂික ඇස්තමේන්තු පිළිබඳ හඳුන්වාදීමේ සටහනෙහි දක්වා ඇති ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සපයා ඇති අතිරේක ප්‍රතිපාදන පිළිබඳ සටහන; සහ

(v) 2017 පළමු කාර්තුවේ මූල්‍ය කාර්ය සාධනය (සාරාංශය) පිළිබඳ වාර්තාව

සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම්** :

(1) (i) රත්නපුර, නව නගරය, සිරිසුමනගම, අංක 423/133 දරන ස්ථානයෙහි පදිංචි අයි. ඩී. මංගලිකා මහත්මියගෙන් ලැබුණු 2017.06.20 දිනැති පෙත්සම;

(ii) කෝකිලායි, මුලතිව්, ශාන්ත ආනා ග්‍රාමීය ධීවර සංවිධානයේ සභාපති එම්. රුක්මාල් තුෂාර ලිවේරා මහතාගෙන් ලැබුණු 2017.07.05 දිනැති පෙත්සම; සහ

(iii) මොරටුව, අඟුලාන, දුම්රියපළ පාර, නවෝදා ගාඩ්න්ස්, අංක 128/23 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. ජී. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු 2017.07.03 දිනැති පෙත්සම

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) බුලත්කොහුපිටිය, වැගල්ල, උඩහවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්. පී. දයානන්ද මහතාගෙන් ලැබුණු 2017.06.14 දිනැති පෙත්සම ගරු විජිත හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(3) නාවලපිටිය, වරකාව, කොස්වත්ත, අංක 382/1 දරන ස්ථානයෙහි පදිංචි කරුණා නවරත්න මහත්මියගෙන් ලැබුණු 2017.07.05 දිනැති පෙත්සම ගරු ආනන්ද අලුත්ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) කොළඹ 02, සෝන්ඩර්ස් කෝට්, අංක 55/9 දරන ස්ථානයෙහි පදිංචි එම්. එච්. එම්. අසන් මහතාගෙන් ලැබුණු 2017.01.23 දිනැති පෙත්සම ගරු මුජිබුර් රහුමාන් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) :** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා වෙනුවෙන් ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2017 අගෝස්තු මස 08 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, ගරු කේ. කේ. පියදාස මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සිඩ්නි ජයරත්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**7. විදේශ විනිමය පනත් කෙටුම්පත** : දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා යෝජනා කළේය.

(අ. භා. 2.50 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

"ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි විශේෂ කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.27 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.24 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 6.10 ට කථානායකතුමා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ 9 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"සහ නියාමනය කිරීම සහතික කරනු පිණිස මේ පනතේ විධිවිධාන";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ 22 වැනි පේළියේ සිට 24 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"බැංකුවේ අධිපතිවරයාගේ විධානයට හා පාලනයට යටත්ව, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස නම් කරනු ලැබ ඇති නිලධරයා හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ සහායක ලෙස නම් කරනු ලැබ ඇති වෙනත් යම් නිලධරයකු විසින් සිදු කරනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ 28 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"යම් තැනැත්තකුට, තැනැත්තන් වර්ගයකට හෝ වර්ගවල, තත්";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 3 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"එවැනි නියමයක් මඟින් නියම කරනු ලැබිය හැකි නියමයන් සහ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 3 වැනි පිටුවේ 27 වැනි පේළියේ සිට 33 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 4 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 4 වැනි පිටුවේ 28 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"කරන ලෙස හෝ ඉල්ලා සිටිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 5 වැනි පිටුවේ 19 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

‘‘විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ගය හෝ වර්ග සඳහා නියෝග’’;

‘‘සංශෝධනය පිළිගත යුතුය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 6 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

‘‘වර්ගය හෝ වර්ග සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කළ හැකි’’;

‘‘සංශෝධනය පිළිගත යුතුය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 6 වැනි පිටුවේ 6 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

‘‘ලද වර්ගයකට හෝ වර්ගවලට අයත් ප්‍රාග්ධන ගනුදෙනුවක් වන්නා’’;

‘‘සංශෝධනය පිළිගත යුතුය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 6 වැනි පිටුවේ 25 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

‘‘අවශ්‍ය කරන තැනැත්තාගෙන් ඉල්ලා සිටිය යුතු ය.’’;

‘‘සංශෝධනය පිළිගත යුතුය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

‘‘වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය’’, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 7 වැනි පිටුවේ 32 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

‘‘සීමාවන් දක්වා සහ එම නියමයන් සහ කොන්දේසිවලට යටත්ව සිදු’’;

‘‘සංශෝධනය පිළිගත යුතුය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 4 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

‘‘හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ සිට බැහැරට යම් සේවාවක් සැපයීමෙන් උපයාගනු ලැබූ විදේශ විනිමය මඟින් විදේශ වත්කමක් අත්පත් කර’’;

‘‘සංශෝධනය පිළිගත යුතුය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 7 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

‘‘සීමාවන් දක්වා සහ එම නියමයන් සහ කොන්දේසිවලට යටත්ව සිදු’’;

‘‘සංශෝධනය පිළිගත යුතුය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 10 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"කුමක් සඳහන් වුව ද, නියමිත දිනයට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත ප්‍රකාශයට පත්කර නොමැති සහ 2006 අංක 5";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 16 වැනි සහ 17 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"මඟින් ලබා ගන්නා ලද දේපළක් නොවන යම් විදේශ විනිමය";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 22 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"වෙනත් යම් ගාස්තුවක්, බද්දක්, අධිභාරයක්, අය කිරීමක් හෝ දඩයක්";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 24 වැනි පේළියේ සිට 29 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"එසේ වුව ද, වටිනාකම ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියනය නොඉක්මවන ශ්‍රී ලංකාවෙන් පිටත පවතින විදේශ විනිමය ප්‍රමාණයක් ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරන එවැනි යම් තැනැත්තකු, ප්‍රේෂණ ගාස්තු හෝ වෙනත් යම් බද්දක්, අධිභාරයක්, අයකිරීමක් හෝ දඩයක් ගෙවීමට යටත් නොවිය යුතු අතර එම වටිනාකම ඉක්මවා ප්‍රේෂණය කරන ලද යම් විදේශ විනිමය ප්‍රමාණයක් මේ උපවගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි ප්‍රේෂණ ගාස්තුවක් ගෙවීමට යටත් විය යුතු ය.

එසේ වුව ද, තවදුරටත්, වටිනාකම ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියනය ඉක්මවන ශ්‍රී ලංකාවෙන් පිටත පවතින විදේශ විනිමය ප්‍රමාණයක් ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරනු ලබන සහ එසේ ප්‍රේෂණය කරනු ලබන විදේශ විනිමය ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද සංවර්ධන බැඳුම්කරයක ආයෝජනය කරනු ලබන එවන් යම් තැනැත්තකු ප්‍රේෂණ ගාස්තු හෝ වෙනත් යම් බද්දක්, අධිභාරයක්, අයකිරීමක් හෝ දඩයක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

(4) ශ්‍රී ලංකාවෙන් පිටත පවතින සහ (3) වැනි උපවගන්තිය යටතේ නියමිත දිනයට පසුව ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරනු ලබන විදේශ විනිමය, විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක පවත්වා ගැනීම හෝ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම සිදු කළ හැකිය.

(5) (3) වැනි උපවගන්තියේ සඳහන් කරනු ලැබූ දේපළ, මහ බැංකුවේ අවසරයකින් තොරව ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගනු ලැබ ඇති වුව ද, එම දේපළ 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ වරදක් සිදු කිරීම මඟින් ලබා ගන්නා ලද දේපළක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

(6) 8 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ නියමයන්ට අනුව'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 9 වැනි පිටුවේ 14 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''නොවන යම් තැනැත්තකු, තැනැත්තන් වර්ගයක් හෝ වර්ග වෙත'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 9 වැනි පිටුවේ 26 වැනි පේළියේ සිට 29 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''හෝ වෙනත් යම් තැනැත්තකුගේ, තැනැත්තන් වර්ගයක හෝ වර්ගවල විදේශ විනිමය ගනුදෙනු හෝ විදේශ වත්කම් පිළිබඳව, මහ බැංකුව විසින් ලිඛිතව ඒ සඳහා බලය දෙන ලද (මෙහි මින්මතු ''බලයලත් තැනැත්තා'' යනුවෙන් සඳහන් කරනු ලබන) විදේශ විනිමය දෙපාර්තමේන්තු නිලධරයකු'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 10 වැනි පිටුවේ 14 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''වෙනත් යම් තැනැත්තකුගේ, තැනැත්තන් වර්ගයක හෝ වර්ගවල'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

11 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 12 වැනි පිටුවේ 23 වැනි සහ 24 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''(අ) මේ පනතේ විධිවිධානවලට පටහැනිව ජංගම ගනුදෙනුවක දී හෝ ප්‍රාග්ධන ගනුදෙනුවක දී විදේශ විනිමය වෙළෙඳාමේ නිරත වීම;'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 12 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"සම්බන්ධ විදේශ විනිමය වෙළඳාමේ නිරත වීම;";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 13 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"සිදු කරන බවට මහ බැංකුව විසින් සෑහීමට පත්වනු ලබන අවස්ථාවක දී, අමාත්‍යවරයා වෙත දැනුම් දීමෙන් අනතුරුව මහ,";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 13 වැනි පිටුවේ 14 වැනි පේළියේ සිට 16 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(ආ) ඡේදය යටතේ ප්‍රදානය කරන ලද බලය ලබාදීම හෝ 4 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (අ) ඡේදය යටතේ ප්‍රදානය කරන ලද අවසර දීම තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකි ය";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 14 වැනි පිටුවේ 10 වැනි පේළියේ සිට 17 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(5) බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන වෙනත් යම් තැනැත්තකු, තැනැත්තන් වර්ගයක් හෝ වර්ග විසින් (1) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේද උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලැබ ඇති අවස්ථාවක දී, මහ බැංකුව විසින්, අමාත්‍යවරයා වෙත දැනුම් දීමෙන් අනතුරුව සහ එම තැනැත්තාට සවන්දීම සඳහා සාධාරණ අවස්ථාවක් ලබා දීමෙන් පසු, රුපියල් මිලියනයකට නොවැඩි මුදලක් හෝ එකී ජංගම ගනුදෙනුව හෝ ප්‍රාග්ධන ගනුදෙනුව අනාවරණය කිරීමෙහි සහ විමර්ශනය කිරීමෙහි ලා මහ බැංකුවට උපචිත වූ යම් වියදම් ද ඇතුළුව එම ජංගම ගනුදෙනුවේ හෝ ප්‍රාග්ධන ගනුදෙනුවේ ප්‍රමාණය හෝ වටිනාකම හෝ විදේශ විනිමයෙන් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් වූ එකී විදේශ වත්කමේ හෝ එහි යම් කොටසක වටිනාකම නොඉක්මවන මුදලක් දඩයක් වශයෙන් ගෙවන ලෙස එකී තැනැත්තාට ලිඛිතව නියම කළ හැකිය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 14 වැනි පිටුවේ 20 වැනි සහ 21 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(අ) ඡේදය යටතේ තීරණය කරන ලද යම් මුදලක් ගෙවන ලෙස නියම කරන හෝ (4) වැනි උපවගන්තියේ (ආ) ඡේදය යටතේ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 15 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"වෙනත් යම් තැනැත්තකු, (5) උපවගන්තිය යටතේ පනවන ලද දඩයක්";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 15 වැනි පිටුවේ 22 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(9) (4) වැනි උපවගන්තියේ (අ) ඡේදය යටතේ මහ බැංකුව වෙත ගෙවන ලද යම්";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12 වැනි වගන්තියේ සිට 14 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

15 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 19 වැනි පිටුවේ 21 වැනි පේළියේ සිට 24 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(ආ) මේ පනත යටතේ ගෙවිය යුතු වන මුදල අය කරවා ගැනීම සඳහා එම තැනැත්තාට විරුද්ධව ඉදිරි නඩු කටයුතු සිදු නොකළ යුතු වීමට හේතු දක්වනු ලැබීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් එම තැනැත්තාට ඔහු ඉදිරියට කැඳවිය යුතු අතර ප්‍රමාණවත් හේතු දැක්වීමට අපොහොසත්";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

16 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 20 වැනි පිටුවේ 15 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"16. මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ ප්‍රදානය කරන ලද යම් අවසරයක්,";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

17 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 20 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"තැනැත්තන් වර්ගයක් හෝ වර්ග, පනතේ හෝ ඒ යටතේ නිකුත්";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 20 වැනි පිටුවේ 31 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"තැනැත්තා හෝ තැනැත්තන් වර්ගය හෝ වර්ග මත විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

18 වැනි වගන්තිය සභා සම්මත විය.

19 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 21 වැනි පිටුවේ 6 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"වන වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී පහත දැක්වෙන";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 21 වැනි පිටුවේ 11 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"වර්ගයක් හෝ වර්ගවලට එරෙහිව එම ලේඛන සාක්ෂි ලෙස";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

20 වැනි වගන්තිය සභා සම්මත විය.

21 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 21 වැනි පිටුවේ 33 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ සෑම නිලධරයකු සහ;";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 22 වැනි පිටුවේ 2 වැනි සහ 3 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"වර්ගයක් හෝ වර්ග හෝ එම තැනැත්තාගේ හෝ තැනැත්තන් වර්ගයක හෝ වර්ගවල බලයලත්";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 22 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"විසින් බලය පවරන ලද මහ බැංකුවේ විදේශ විනිමය";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 22 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"මහ බැංකුව විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 22 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(2) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධරයකු හෝ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

22 වැනි වගන්තියේ සිට 27 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

28 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 25 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

29 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 25 වැනි පිටුවේ 24 වැනි පේළියේ සිට 31 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(අ) ඉවත් කරන ලද පනත යටතේ පවරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවත්නා සියලු සිවිල් නඩු, අපරාධ නඩු සහ නීති කෘත්‍ය, නියමිත දිනයේ සිට ඉවත් කරන ලද පනත යටතේ වූ සියලු සිවිල් නඩු, අපරාධ නඩු සහ නීති කෘත්‍ය, ලෙස සලකනු ලැබිය යුතු අතර එකී පනත යටතේ අසා නිම කළ යුතු ය; සහ

(ආ) ඉවත් කරන ලද පනත යටතේ පවරන ලද සහ නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ දී අවසන් නොවී පවත්නා වූ සියලු විමර්ශන සහ පරීක්ෂණ නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි ඉවත් කරන ලද පනත යටතේ පවරන ලද විමර්ශන සහ පරීක්ෂණ ලෙස සලකනු ලැබිය යුතු අතර නියමිත දින සිට මාස හයක් ඇතුළත එකී පනත යටතේ අසා සිට නිම කරනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 26 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 3 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

30 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 26 වැනි පිටුවේ 18 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(3) මේ පනතේ කාර්ය සඳහා "ශ්‍රී ලංකාවේ"";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

31 වැනි වගන්තිය සභා සම්මත විය.

32 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 29 වැනි පිටුවේ 4 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

" "අමාත්‍යවරයා" යන්නෙන් මහ බැංකුව විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ; ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

නව වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා මතු සඳහන් නව වගන්තිය යෝජනා කළේය.

24 වැනි පිටුවේ 26 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කිරීමට,—

"දණ්ඩන. 26. (1) මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් නියෝගයන්ට, නියමයන්ට හෝ විධානයන්ට පටහැනිව ක්‍රියා කරනු ලබන, තැනැත්තකුට, ඒ සඳහා දඬයක් නියම කරනු ලැබ නොමැති අවස්ථාවක දී, සහ බැංකුව විසින්, ලිඛිතව, එම දැන්වීමේ සඳහන් කරනු ලැබිය හැකි කාල සීමාවක් තුළ, රුපියල් ලක්ෂයකට නොවැඩි මුදලක් දඬයක් වශයෙන් ගෙවැනි ලෙස එම තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ පනවන ලද දඬයක් හේතුවෙන් අගතියට පත් යම් තැනැත්තකුට, ඒ තැනැත්තා වෙත ඒ දඬය ගෙවන ලෙස නියම කර දන්වනු ලැබීමෙන් පසු දින තිහක් තුළ එම දඬය ගෙවන ලෙස කරන ලද නියමයට එරෙහිව පරීක්ෂණ මණ්ඩලය වෙත අභියාචනය කරනු ලැබිය හැකි අතර පරීක්ෂණ මණ්ඩලය විසින් 13 වැනි වගන්තියේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුව ඒ අභියාචනය නිශ්චය කළ යුතු ය.";

"නව වගන්තිය දෙවැනිවර කියවිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"නව වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**උපලේඛනය**

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 30 වැනි පිටුවේ උපලේඛනය පහත ආකාරයට සංශෝධනය කිරීමට,—

"සාමාජිකයන්ගේ උපදෙස්වලට පසු, කිසියම් නිශ්චිත ගනුදෙනුවක් ජංගම ගනුදෙනුවක් ලෙස හෝ ප්‍රාග්ධන ගනුදෙනුවක් ලෙස සලකනු ලැබිය හැකි දැයි සලකා බැලිය හැකි ය." යන වචන වෙනුවට "අදාළ සාමාජිකයන් විමසීමෙන් පසු, කිසියම් නිශ්චිත ගනුදෙනු, ජංගම ගනුදෙනු ලෙස හෝ ප්‍රාග්ධන ගනුදෙනුවක් ලෙස සලකනු ලැබිය හැකි දැයි නිශ්චය කළ හැකි ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"උපලේඛනය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**දීර්ඝ නාමය**

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 1 වැනි පිටුවේ දීර්ඝ නාමය පහත ආකාරයට සංශෝධනය කිරීමට,—

"විධිමත් කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද; විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම සහ විධිමත් කිරීම" යන වචන ඉවත්කර ඒ වෙනුවට "නියාමනය කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද; විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම" යන වචන ආදේශ කරන්න. ;

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය

"ප්‍රඥප්ති වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, අංක 43 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය අනුව, මතු පළ වන අන්දමට පක්ෂව 94; විපක්ෂව 18; යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**8. කල් තැබීම (අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් රජයේ වගකීම් ඉටු කිරීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(අ. භා. 6.57 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2017 ජූලි මස 07 වැනි දින සභා සම්මතිය අනුව, 2017 ජූලි මස 26 වැනි බදාදා අ. භා. 1.00 වනතෙක් කල් ගියේය.